ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | මූල්‍ය බුද්ධි ඒකකය |
| දිනය | 2019 පෙබරවාරි 26 |

**ශ්‍රී ලංකාව ලබා ඇති ප්‍රගතිය, මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් අනුමත කරයි**

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ප්‍රතිපත්ති සම්පාදකයා ලෙස කටයුතු කරනු ලබන මූල්‍ය කාර්ය සාධක බලකාය (Financial Action Task Force – FATF) විසින්, ශ්‍රී ලංකාව, එහි ක්‍රියාකාරී සැලැස්ම සම්පූර්ණ කර ඇති බවට මූලික නිර්ණය ප්‍රකාශයට පත්කර ඇති අතර, ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවත්විමේ ප්‍රතිසංස්කරණයන් ක්‍රියාත්මක කිරීම අරඹා ඇති බවට සහ එම කටයුතු තිරසාර මට්ටමින් පවත්වාගෙන යනු ලබන බවට ද, එමෙන්ම අනාගතයේදී ඒ සඳහා අවශ්‍ය දේශපාලන කැපවීම පවතින බවටද තහවුරු කර ගැනීම සඳහා වූ එතැන් පරීක්ෂාවක් නිර්දේශ කරන ලදී. 2019 පෙබරවාරි 20-22 කාලපරිච්ඡේදය තුළදී පැරීසියේ පවත්වනු ලැබූ මූල්‍ය කාර්ය සාධක බලකා සැසිවාරයේ දී මෙම තීරණය ගන්නා ලදී.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සඵලතාව (Effectiveness) සම්බන්ධව ලබා ඇති ප්‍රගතිය ඇගයීම සඳහා මූල්‍ය කාර්ය සාධක බලකායේ ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ සමාලෝචන කණ්ඩායම (International Cooperation Review Group – ICRG) විසින් ශ්‍රී ලංකාව සමාලෝචනයට ලක් කරන බව 2016 ඔක්තෝබර් මාසයේ දී මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් ශ්‍රී ලංකාවට දැනුම් දෙන ලදී. සාකච්ඡා සහ ප්‍රගති සමාලෝචන වාර්තාවන් කිහිපයකට පසුව ජාත්‍යන්තර සහයෝගීතාව, අධීක්ෂණය, නෛතික පුද්ගලයන් සහ සැකසුම් සහ න්‍යෂ්ටික අවි ව්‍යාප්තිය සම්බන්ධයෙන් ඉලක්කගත මූල්‍ය සම්බාධක (උතුරු කොරියාව සහ ඉරානයට අදාල) ආදී වශයෙන් වන කරුණු 4 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව අවශ්‍ය ප්‍රගතිය පෙන්වා නොමැති බව මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් ශ්‍රී ලංකාවට දැනුම් දෙන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, 2017 වසරේ ඔක්තෝබර් මසදී ආර්ජන්ටිනාවේ බුවනෝස් අයර්ස්හි දි පැවති වාර්ෂික සමුළුවේ දී, ශ්‍රී ලංකාව මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ ක්‍රමෝපායන්ගේ දුර්වලතා සහිත රටක් ලෙස මූල්‍ය කාර්ය සාධක බලකායේ “අළු ලේඛනය” (Gray List) ලෙස හඳුන්වන අනුකූලතා ලේඛනයෙහි ලැයිස්තුගත කරන ලද අතර, එම දුර්වලතා මඟ හරවා ගැනීම සඳහා ක්‍රියාත්මක කළ යුතු කාල රාමුවකට යටත් වූ ක්‍රියාකාරී සැලැස්මක් ශ්‍රී ලංකාවට ලබාදෙන ලදී.

2017 නොවැම්බර් මාසයේ සිදු වූ මෙම ලැයිස්තුගත වීමෙන් පසුව, මූල්‍ය බුද්ධි ඒකකය විසින් අනෙකුත් පාර්ශවකරුවන් සමග එක්ව මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් ලබාදුන් ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී පියවර රාශියක් ගන්නා ලදි. ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී ලබාගත් ප්‍රගතිය පිළිබඳව ශ්‍රී ලංකාව විසින් මූල්‍ය කාර්ය සාධක බලකාය වෙත නිරන්තරයෙන් වාර්තා කරන ලදී. මූල්‍ය කාර්ය සාධක බලකා සැසිවාරයේ දී ගනු ලැබූ තීරණය අනුව, පසු විපරම් කණ්ඩායමක් 2019 මැයි මාසය තුළ දී එතැන් පරීක්ෂාවක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන අතර එහි දී ඔවුන් පෞද්ගලික අංශයේ පාර්ශවකරුවන් ඇතුළු අදාල සියළුම පාර්ශවකරුවන් සහ ඉහළම දේශපාලන අධිකාරීන් හමු වී මූල්‍ය කාර්ය සාධක බලකායේ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීම සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ක්‍රියාවන් සඳහා ශ්‍රී ලංකාවේ දේශපාලන කැපවීම තහවුරු කර ගැනීමට නියමිතය. 2019 ජූනි මාසයේ දී පැවැත්වීමට නියමිත මූල්‍ය කාර්ය සාධක බලකා සැසිවාරයේ දී ඇගයුම්කරුවන්ගේ නිර්දේශ ඉදිරිපත් කිරීම සිදුකරනු ලබන අතර, එමගින් ශ්‍රී ලංකාවට “අළු ලැයිස්තුවෙන්” ඉවත් වීමට හැකියාව ලැබෙනු ඇත.

ශ්‍රී ලංකාව පිළිබඳව මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් සිදුකරන ලද සම්පූර්ණ ප්‍රකාශය පහත පරිදි වේ.

2017 නොවැම්බර් මාසයේ සිට, ශ්‍රී ලංකාව විසින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ කටයුතු වල සඵලදායීත්වය ශක්තිමත් කිරීම සඳහා සහ අදාල තාක්ෂණික දුර්වලතා මග හරවා ගැනීම සඳහා මූල්‍ය කාර්ය සාධක බලකාය සහ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම සමග කටයුතු කිරීමට ඉහළ මට්ටමේ දේශපාලනික කැපවීමක් ඇති කරගන්නා ලදි. මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් ලබාදුන් ක්‍රියාකාරී සැලැස්ම සම්පූර්ණ කර ඇති බවට මූලික නිර්ණය ප්‍රකාශයට පත්කර ඇති අතර, ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවත්වීමේ ප්‍රතිසංස්කරණයන් ක්‍රියාත්මක කිරීම අරඹා ඇති බවට සහ එම කටයුතු තිරසාර මට්ටමින් පවත්වාගෙන යනු ලබන බවට ද, එමෙන්ම අනාගයේ දී ඒ සඳහා අවශ්‍ය දේශපාලන කැපවීම පවතින බවටද තහවුරු කර ගැනීම සඳහා වූ එතැන් පරීක්ෂාවක් නිර්දේශ කරන ලදී. විශේෂයෙන්ම, ශ්‍රී ලංකාව විසින් පහත දැක්වෙන මූලික ප්‍රතිසංස්කරණයන් සිදුකර ඇත. (1) අන්‍යෝන්‍ය වශයෙන් නෛතික සහයෝගය සැපයිය හැකි බව සහතික කිරීම සඳහා සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාවය දැක්වීමේ පනතට (MACMA) සංශෝධන ඉදිරිපත් කිරීම. (2) නමෝද්දිෂ්ට මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් වෙත, ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියාකිරීමේ රීති (CDD Rules) නිකුත් කිරීම, අවශ්‍ය අනෙකුත් උපදේශන නිකුත් කිරීම සහ සුපරීක්ෂණ ක්‍රියාවලිය හරහා මෙම රීති ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇති ද යන්න තහවුරු කර ගැනීම. (3) අවදානම මත පදනම් වූ සුපරීක්ෂණයන් පුළුල් කිරීම සහ අවශ්‍ය පරිදි කඩිනම් සහ අදාල නීතිමය පියවර සහ සම්බාධක තුලින් මූල්‍ය ආයතන, අවදානම ඉහළ නමොද්දිෂ්ට මූල්‍ය නොවන ව්‍යාපාර සම්බන්ධව කටයුතු කිරීම. (4) නෛතික පුද්ගලයින් සම්බන්ධයෙන් වන ප්‍රතිලාභී හිමිකාරත්වය පිළිබඳ තොරතුරු නිසි බලධාරීන්ට කාලෝචිත අයුරින් ලබාගත හැකි බව පෙන්වීමට සිද්ධි අධ්‍යනයන් සහ සංඛ්‍යානයන් සැපයීම. (5) භාර ආඥාපනත සංශෝධනය කිරීම සහ එය ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇති බව සනාථ කිරීම. (6) ඉරානයට අදාල එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ඉලක්කගත මූල්‍ය සම්බාධක තන්ත්‍රයක් පිහිටුවීම, එම ක්‍රියාවලිය ආරම්භ කර ඇති බව සනාථ කිරීම සහ උතුරු කොරියානු ප්‍රජාතන්ත්‍රවාදී ජනතා ජනරජයට අදාල එක්සත් ජාතීන්ගේ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇති බව සනාථ කිරීම.